# ගැටුම් වාර්තා කිරීම සඳහා මාධ්‍යවේදීන්ට පුහුණුවක් අවශ්‍ය ද යන්න විමසා බැලීම
## (2013-08-01) දින වැලිවේරිය සහ බැලුම්මහර ප්‍රදේශවල සිදු වූ ගැටුමට විශේෂිතව)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**එච්. ඒ. ගයාන් මධුශංඛ**
**විජයානන්ද රූපසිංහ**

**සංක්ෂේපය**

ප්‍රතිපත්ති සහ මතය අනුව ඉතාම බරපතල ලෙස එකඟ නොවීම හෝ තර්ක කිරීම හෝ දුරදිග යාම, යුද්ධයක් හෝ අරගලයක් හෝ නොගැළපුම් සහගත තත්ත්වයක් දක්වා ඇතිවීම ගැටුම්කාරී අවස්ථාවකි. මෙවැනි ගැටුම්කාරී අවස්ථාවන් සඳහා ඉහළ ප්‍රවෘත්ති වටිනාකමකින් යුක්තය. ගැටුම්කාරී සංවේදී අවස්ථා ආවරණය කිරීම සඳහා මාධ්‍යවේදීන් සිය උපරිම ශක්‍යතාවන් යොදාගන්නා අතර ජනමාධ්‍ය ආයතනද එවැනි සිදුවීම් හමුවේ මාධ්‍යවේදින්ගෙන් ගුණාත්මක වාර්තාකරණයක් බලාපොරොත්තු වෙයි. ගැටුම්කාරී අවස්ථා වාර්තා කිරීමේදී මාධ්‍යවේදියා ඉතා සුපරීක්ෂාකාරී විය යුතුය. මේ හේතුවෙන් වඩාත් ගුණාත්මක වාර්තාකරණයක නියැලීමට නම් මාධ්‍යවේදීන් ගැටුම්කාරී තත්ත්වයන් පිළිබඳව නිසි අවබෝධයකින් යුක්ත විය යුතු ය.

ගැටුම් වාර්තාකිරීම සඳහා ලංකාවේ මාධ්‍යවේදීන්ට පුහුණුවක් අවශ්‍ය ද? යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ගැටළුව වේ. මාධ්‍යවේදීන් මුහුණදුන් අභියෝග හඳුනා ගැනීමත් ඔවුන්ට කුමන ආකාරයක පුහුණුවක් අවශ්‍ය ද යන්නත් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

2013-08-01 දින වැලිවේරිය සහ බැලුම්මහර සිදුවූ ගැටුම්කාරී තත්ත්වය ලංකාවේ ඇතිවූ සුවිශේෂී අවස්ථාවකි. උද්ඝෝෂණයක් විසිරුවා හැරීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් ජනතාවට වෙඩි තබන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් තිදෙනෙකු මිය ගිය අතර 29 දෙනෙකු ආබාධිත තත්ත්වයට පත්විය. මෙම අධ්‍යයනය සඳහා එම ගැටුම සිද්ධියක් වශයෙන් යොදාගැනෙයි.  මෙම ගැටුම වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන් 10 දෙනෙකු පරමාර්ථගත හා විනිශ්චයමය නියැදි ක්‍රමය යටතේ හඳුනාගෙන ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යටතේ දීර්ඝ සම්මුඛ සාකච්ඡාවකට භාජන කරන ලදී. ඔවුන්ගේ අත්දැකීම් සහ ඔවුන්ට එල්ලවුණු අභියෝග හඳුනා ගැනීමෙන් කුමන ආකාරයක පුහුණුවක් මාධ්‍යවේදීන් සඳහා ලබාදිය යුතු ද යන්න මෙම පර්යේෂණයෙන් අධ්‍යයනය කර ඇත.

මෙම අධ්‍යයනයෙන් ලබාගන්නා ලද පොදු නිගමනය වූයේ ගැටුම්කාරී තත්ත්වයන් වාර්තා කිරීම සඳහා ලංකාවේ මාධ්‍යවේදීන්ට නිසි පුහුණුවක් අවශ්‍ය බවයි. ගැටුම්කාරී තත්ත්වයකදී ගුණාත්මක දර්ශන ලබාගැනීම සඳහා මාධ්‍යවේදීන් ස්ථානගත විය යුතු ආකාරය, ක්ෂණික තීරණ ගැනීම සඳහා අත්දැකීම් ප්‍රමාණවත් නොවීම, ප්‍රහාරයකට ලක් නොවී වාර්තාකරණයේ යෙදීමට උපාය උපක්‍රම පිළිබඳ නොදැනුවත් බව, ඒ මොහොතේ ඇතිවන මානසික කම්පන තත්ත්වයන් සහ පශ්චාත් ව්‍යසන ක්ලමත අක්‍රමතාවය (Post-traumatic stress disorder) වැනි තත්ත්වයන් සඳහා මුහුණ දීමට නොහැකිවීම, මූලික ප්‍රථමාධාර පිළිබඳව නොදැනුවත්කම, අගතියට පත්වූ විට ගත හැකි නීතිමය පියවර පිළිබඳව නොදැනුවත්කම මාධ්‍යවේදීන් මුහුණදෙන අභියෝග ලෙස මෙම අධ්‍යයනයෙන් හඳුනාගෙන ඇත.

මූල පද - ගැටුම් වාර්තාකරණය, පුහුණුව, ගැටුම්කාරී තත්ත්ව

*1., ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*